චක්‍රලේඛ අංක : 06/2014

මගේ අංකය : බප/සසේකො/6-චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2014-11- 18

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල,
ස.ණ.ස. සමිති සහ ස.ණ.ස. සංගම්වල ගරු සභාපතිවරුන් වෙත ,

**සමුපකාර සේවක වැටුප් සහ දීමනා ප්‍රතිශෝධනය කිරීම.**

අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ 2015 අයවැය ලේඛනය මඟින් 2015-01-01 දින සිට රජයේ නිලධාරීන් ගේ වැටුප් වැඩිකිරීමක් සිදුකර ඇත. ඊට සමගාමීව, බස්නාහිර පළාත් සමුපකාර සේවකයින්ගේ වැටුප් සහ දීමනා ප්‍රතිශෝධනය කිරීමක් සිදු කරන ලෙස ගරු විෂයභාර ඇමතිතුමා විසින් උපදෙස් ලබා දී ඇත. මේ පිළිබඳව බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් ගම්පහ, කළුතර සහ කොළඹ දිස්ත්‍රික්කයන් හි සාකච්ඡා වට තුනක් ද පවත්වන ලදි. එකී සියළුම කරුණු සලකා බැලීමෙන් අනතුරුව 2014 දෙසැම්බර් වැටුපට අදාල කර ගනිමින් ක්‍රියාත්මක වන පරිදි, බස්නාහිර පළාත් සමුපකාර සේවකයින්ගේ වැටුප් සහ දීමනා සම්බන්ධයෙන් පහත ප්‍රතිශෝධන සිදු කිරීමට මෙම කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

I. 2012.04.30 දිනැති 5/2012 චක්‍රලේඛය මඟින් අනුමත කරන ලද 15% විශේෂ දීමනාව දැනට ලබන මූලික වැටුපට එකතු කළ යුතුය.

II. ඉහත පරිදි මූලික වැටුප ගණනය කිරීමෙන් අනතුරුව, එකී මූලික වැටුප පදනම් කර ගනිමින්, 15% ක අන්තර් දීමනාවක් ගණනය කර, වැටුපට අමතරව ගෙවිය යුතුය. මෙම දීමනාව, අවමය රු.1,000/- ක් ද, උපරිමය රු.3,000/- ක් ද නොඉක්මවිය යුතුය.

III. තාවකාලික, අනියම් සහ දෛනික වැටුප් ලබන සේවකයින් සඳහා මෙම දීමනාව ගෙවීමේ දී, එදෛනික වේතනය මත ගණනය කර ගෙවිය යුතු වේ.

IV. ගිවිසුම් පදනම මත සේවය කරනු ලබන සේවකයින් හට මෙම දීමනාව හිමි නොවේ.

02. ඉහත පරිදි කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අන්තර් දීමනාව, කම්කරු නීතිරීතිවලට අනුකූලව, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා නියමිත පරිදි දායක මුදල් ගෙවීමට, අදාල කර ගත යුතුය.

03. කොමිෂන් සභා නියමය පරිදිය.

ඩබ්. පී. එම්. ජී. ආර්. ශාන්ත කුමාර මුහන්දිරම්,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් : 01. ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත.
02. ලේකම්, ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය - බස්නාහිර පළාත.
03. සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර් - බස්නාහිර පළාත.
04. අධ්‍යක්ෂ, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - බස්නාහිර පළාත.
05. ලේකම්, සමුපකාර සමුපකාර සේවක කොමිෂන් සභාව.
06. පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්, ....................
07. සියළුම වෘත්තීය සමිති සංගම්